රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 04/2022

මගේ අංකය : EST-3/DICIP/06/0052
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2022.09.27

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**රජයේ නිලධරයන් විසින් සමාජ මාධ්‍ය ජාලා වෙත අදහස් ප්‍රකාශ කිරීම**

2019.02.27 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2019 මඟින් සංශෝධිත ආයතන සංග්‍රහයේ පළමු වැනි කාණ්ඩයේ XXXI වැනි පරිච්ඡේදයේ 3:2 උපවගන්තිය, ආයතන සංග්‍රහයේ දෙවැනි කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 6 වන හා 7 වන වගන්ති සහ "ජනමාධ්‍යයන් වෙත ප්‍රකාශ නිකුත් කිරීම" යන මැයෙන් නිකුත් කරන ලද 2015.01.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 4/2015 වෙත අවධානය යොමු කරවමි.

02. ආයතන සංග්‍රහයෙහි දෙවැනි කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 6 වන හා 7 වන වගන්තීන්හි දැක්වෙන විධිවිධාන අනුගමනය නොකර රජයේ නිලධරයකු විසින් සමාජ මාධ්‍ය ජාලා වෙත අදහස් දැක්වීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2015 හි 03 වන වගන්තියෙහි දක්වා ඇති පරිදි විනයානුකූලව කටයුතු කිරීමට හේතුවන වරදක් වේ.

03. තවද, ආයතන සංග්‍රහයෙහි පළමු වැනි කාණ්ඩයේ XXXII වැනි පරිච්ඡේදයේ 1 වන වගන්තිය අනුව දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීමට හිමිකම් නොමැති නිලධරයකු විසින් සිදු නොකළ යුතු ක්‍රියාවක්, දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීමට හිමිකම නොමැති නිලධරයකු විසින් සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ සිදු කිරීම ද විනයානුකූලව කටයුතු කිරීමට හේතුවන වරදක් වේ.

04. එබැවින් එවැනි නිලධරයන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතු වේ.

එම්.එම්.පී.කේ.මායාදුන්නෙ
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය


දුරකථන : 0112-692159
ෆැක්ස් : 0112-692158
විද්‍යුත් ලිපිනය : pubad.estad3@gmail.com